# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 අගෝස්තු මස 28 වන සඳුදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 10.11 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩ් තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අර්ෂාඩ් නිසාම්ඩීන්
උදේන විජේරත්න
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
තුවාන් ආමීත් මොහමඩ් අක්රම්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
රන්දීර් රොද්‍රිගෝ

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*"2017.08.22 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ එකඟතාවය මත අද දින සභාවේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් පොදු කටයුතු විෂයයන්ට පමණක් සීමා වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද දින විවාදයට ගැනීම පිළිබඳව වැඩිදුරටත් සලකා බැලීම සඳහා පක්ෂ නායක රැස්වීමක් ලබා දෙන මෙන් ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාවට පළාත් සභාව එකඟ වූ බැවින්, ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා පූ.භා. 10.15 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදුයෙන්, පූ.භා. 10.46 ට යළිත් රැස් විය.***

## 02. විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය :

***අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුකාරතුමා මඟින් මෙම පළාත් සභාවේ අදහස් විමසා එවා ඇති විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය, අද දින විවාද නොකර වෙනත් දිනයකදී විවාදයට ගැනීමට අවස්ථාව ලබා දෙන මෙන් ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාභිමුඛ කරන ලදී.***

***අනතුරුව, ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා සභාවේ එකඟතාවය විමසීම සඳහා සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***අනතුරුව, 10.56 ට පමණ ගරු සභාපතිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාවට සභාවේ එකඟත්වය විමසීමට සූදානම් වූ විට, සභා ගර්භයේ මැදට ගරු මන්ත්‍රීවරුන් පිවිසීම නිසා ඇති වූ නොසන්සුන්තාවය මත හා සභාවේ සෙංකෝලය ලබා ගැනීමට තැත් කිරීම හේතුවෙන් සෙංකෝලයට හානි සිදු වූ අතර, ගරු සභාපතිතුමාගේ හදිසි දොරටුවෙන් එසේ හානි වූ සෙංකෝලය රැගෙන ගොස් සුරක්ෂිත කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව පූ.භා. 11.10 ට තාවකාලිකව අත්සිටුවන ලදී. සෙංකෝලය ස්ථාන ගත කිරීමෙන් අනතුරුව පූ.භා. 11.40 ට පළාත් සභාව යළිත් රැස් විය.***

***අනතුරුව, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට සභාවේ එකඟත්වය යළිත් විමසන ලදුයෙන්, පළාත් සභාව 61(3) රීතිය යටතේ යෝජනාවට පක්ෂව 51 යි විපක්ෂව 41 යි වැළකුණු 01 යි යනුවෙන් බෙදුණේය.***

***මීට පෙර ගරු ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කළ ආකාරයටම ගරු ආණ්ඩුකාරතුමා විසින් විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ කෙටුම්පත පිළිබඳව පළාත් සභාවේ අදහස් විමසා තමන් වෙත එවීම සඳහා කාලය දීර්ඝ කර ලබා දෙන බවට දුරකථනයෙන් තමාව දැනුවත් කළ බවත්, ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් සභාව දැනුවත් කරන ලදී.***

## 03. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"දැන් මෙම සභාව කල් තැබිය යුතු ය."*

***ඊට අනුකූලව, පළාත් සභාව පූ.භා. 11.56 ට, 2017 සැප්තැම්බර් මස 04 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.08.28
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/28
Minuts 2017.08.28- Hansard Section